රාජ්‍ය භාෂා කොමිෂන් සභාව - 2022

----------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිෂන් සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිත අංක 7 හි 49 ඡේදය ප්‍රකාරව දේපළ, පිරියත හා උපකරණ අයිතමයක් ප්‍රත්‍යාගණනය කිරීමේදී එම වත්කම අයත්වන පන්තිය මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කළ යුතු වුවත්, සම්පූර්ණයෙන් ක්ෂය කර අවසන් ලී බඩු හා කාර්යාල උපකරණ පමණක් ප්‍රත්‍යාගණනය සිදුකර තිබුණි. | ඉදිරියේ දී සිදුකරන ප්‍රත්‍යාගණන වලදී වත්කම් අයත් වන දේපල, පිරියත හා උපකරණ පන්තියම මුලුමනින්ම ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කරන බව දන්වමි. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොමිෂන් සභාව විසින් මූලික වැටුප පමණක් පදනම් කරගනිමින් පාරිතෝෂික ගණනය කිරීම හේතුවෙන් රු.880,682 ක් අඩුවෙන් පාරිතෝෂික වෙන් කිරීම් සිදු කර තිබුණි. | රා.භා.කො.සභාවේ පාරිතෝෂික වෙන්කිරීම මෙතෙක් සිදුකරනු ලැබූයේ ඒකාබද්ධ වැටුප පමණක් සලකා බලමිනි. | පනතේ විධිවිධාන ප්‍රකාරව පාරිතෝෂික ගණනය කළ යුතුය. |
| (ආ) | සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලේ දායක මුදල් ගෙවීම් ප්‍රමාදවීම හේතුවෙන් රු.78,487 ක ගෙවියයුතු අධිභාර මුදල සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි. | මෙම ප්‍රමාදවීම් සම්බන්ධව මේ වන විට රාජ්‍ය භාෂා කොමිෂන් සභාව විසින් විමර්ශනයක් ආරම්භ කර ඇති බව දන්වමි.<br>තවද 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල 2022 වර්ෂයට අදාල හෙළිදරව් කිරීමක් ලෙස ඉදිරිපත් කරමි. | සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට ගෙවිය යුතු දායක මුදල් ප්‍රමාද නොකර නිශ්චිත දිනට ගෙවිය යුතුය. |
| (ඇ) | ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය විසින් 2016 ජුනි 02 දින කල්බදු ක්‍රමය යටතේ මිලදී ගෙන එදිනම කොමිෂන් සභාවේ භාවිතයට ලබාදී තිබූ මෝටර් රථයක් 2022 මාර්තු 22 දින රු.4,500,000 කට තක්සේරු කර තිබුණ ද එම රථය කොමිෂන් | වත්මන් අමාත්‍යාංශයේ අනුමතිය පරිදි වාහනය පවරා ගැනීමට කටයුතු කරන බව දන්වමි. | මෝටර් රථ විධිමත් පරිදි පවරාගෙන මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතුය. |

සභාවට පවරාගෙන මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. තවද, 2015 ජුනි 24 දින ජාතික භාෂා ව්‍යාපෘතිය සඳහා කැනේඩියන් ඉන්ටර්නැෂනල් ඩිවෙලොප්මන්ට් ඒජන්සිය විසින් කොමිෂම වෙත පවරන ලද යතුරු පැදියේ වටිනාකමද මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | මුළු පිරිවැය රු .19,345,430 ක් වූ දේපළ පිරියත හා උපකරණවල එක් එක් අයිතමයන්ගේ පිරිවැය තහවුරු කර ගැනීමට හැකිවන පරිදි ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | අදාළ ක්ෂය කිරීම් ඇතුලත්කර ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීමට හා 2023 ගිණුම් ප්‍රකාශන සෑදීමේ දී වත්කම් වෙන් වෙන් වශයෙන් හඳුනාගෙන ක්ෂය කිරීම් වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යායුතු අතර ක්ෂය වෙන් කිරීම තහවුරු කර ගැනීමට අදාළ පොත්පත් හා උපලේඛන විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.9,548,362 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.552,524 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.10,100,886 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ක්ෂය වීම්, අලුත්වැඩියා හා නඩත්තු වියදම් සහ උපයෝගීතා සේවාවන් හා වෙනත් වියදම් රු.8,724,391කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දැනුවත් කිරීමේ වැඩසටහන් හා වැඩමුළු සඳහා බෙදා හැරීමට 2012 වර්ෂයට පෙර මුද්‍රණය කර තිබූ එහෙත් එම කාර්යයන් ඉටු නොකිරීම හේතුවෙන් එකතුව රු.292,855 ක් වූ පාරිභාෂික පදමාලා සහ කෙටිකාලීන පාඨමාලා පොත් 3998 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන විටත් බෙදාහැර නොතිබුණි. | පොත් පාසල් පුස්තකාල වෙත ලබාදීමට කටයුතු කරන බව දන්වමි. | අවශ්‍යතාවය හඳුනානොගෙන මුද්‍රණය කිරීම සහ වර්ෂ 10කට වඩා වැඩි කාලයක් මෙම පොත් ප්‍රයෝජනයට නොගැනීම සම්බන්ධව අදාල නිලධාරීන් වගකිව යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාවෙන් කුලියට ගත් ගොඩනැගිල්ලේ රු.993,596ක් වැයකර ඉදිකරන ලද සේදුම් කාමරයේ වටිනාකම නැවත අයකර ගතයුතු වටිනාකමක් ලෙස ගිණුම්ගත නොකර ප්‍රාග්ධනිත කර තිබුණි. | කොමිෂන් සභාව ජනජයසිටි ගොඩනැගිල්ලේ බදු කාලසීමාව අවසානයේදී තවදුරටත් එම සේදුම් කාමරය වත්කමක් ලෙස සභාවේ දේපළට වටිනාකමක් එකතු කරන්නේ නම් එම අවස්ථාවේදී සභාවේද එකඟතාවය සහිතව පමණක් කොමිෂන් සභාව වෙත ප්‍රතිපූරණය කරන බව නාගරික කොමසාරිස් විසින් ප්‍රකාශ කරන ලදි. | මෙම මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන රාජ්‍ය වියදම් පාලනය කිරීම සඳහා වූ ජාතික අයවැය චක්‍රලේඛයේ විධිවිධානයන්ගෙන් බැහැරව කොමිෂම විසින් වාර්ෂික රු.7,284,000ක බදු කුලියකට කාර්යාල ගොඩනැගිල්ලක් කුළියටගෙන තිබුණි. | අමාත්‍යාංශයට අයත් ගොඩනැගිලි පරිශ්‍රයකින් ඉඩ වෙන්කර ගැනීමට විමසීම කළද එසේ ලබාගැනීමට නොහැකි විය. එබැවින් කෝට්ටේ මහ නගර සභාවට අයත් ජනජයසිටි ගොඩනැගිල්ලෙන් ඉතිරි වී තිබූ ප්‍රමාණය කොමිෂන් සභාව වෙත ලබාගැනීමට කටයුතු කරන ලදී. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |